Sinhalese | සිංහල

## ප්‍රචණ්ඩත්වයෙන් තොර සතියක් සඳහා වන ව්‍යාපාරය
## 2023 ඔක්තෝබර් 16- 22

ප්‍රචණ්ඩත්වයෙන් තොර සතියක් යනු, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා ලොව පුරා ක්‍රියාත්මක වන ව්‍යාපාරයකි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ගැන දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා සෑම වසරක ම මෙල්බන් නොදර්න් මෙට්‍රොපොලිටන් කලාපයේ ප්‍රජා සාමාජිකයන් හා සංවිධාන, ප්‍රචණ්ඩත්වයෙන් තොර සතියක් සඳහා වන ව්‍යාපාරයට සහභාගී වෙති.

අඳින ලද හෝ පින්තාරු කරන ලද ටී-ෂර්ට් අතථ්‍ය හෝ සැබෑ රෙදිවැලවල ප්‍රදර්ශනය කරමින් පුද්ගලයෝ ප්‍රචණ්ඩත්වයෙන් තොර සතිය සමරති. මේ සම්බන්ධ සංකල්පය සරලය: එක් එක් සහභාගී වන්නන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඔවුන්ගේ හැඟීම් ටී-ෂර්ට් මගින් ප්‍රකාශ කිරීම මෙහි දී සිදු වේ. මෙතැනින් කඩදාසි ටී -ෂර්ටයක් බාගත කරගන්න.

## ප්‍රචණ්ඩත්වයෙන් තොර සතියක් සඳහා වන ව්‍යාපාරයට එක්වන්න.

මෙම වසරේ තේමාව වන්නේ 'සවන් දෙන්න, **විශ්වාස කරන්න**, සම්බන්ධ වන්න: උදව් කළ හැකි සංවිධාන හා පුද්ගලයන් සමග සම්බන්ධ වන්න' යන්නය.

- නොනැසී ජීවත් වන වින්දිතයන් සිය කතාව හොඳින් ම දන්නා නිසා ඔවුන්ට සාවධානව සවන්දෙන්න.
- නොනැසී ජීවත් වන වින්දිතයන් සිය අත්දැකීම් බෙදාහදා ගන්නා විට ඔවුන් විශ්වාස කරන්න.
- උදව් ලබා දිය හැකි සේවා යෝජනා කර ඒවායින් සිදු කරන්නේ මොනවාදැයි පැහැදිලි කරන්න.

## සමාජ මධ්‍ය ඔස්සේ ඔබේ ටී-ෂර්ටය සමග හුවමාරු කර ගැනීම සඳහා වන පණිවුඩ

- මේ ප්‍රචණ්ඩත්වයෙන් තොර සතියයි. අපට එක්ව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අවසන් කළ හැකිය.
- ප්‍රචණ්ඩත්වයෙන් තොර සතිය සඳහා වන ව්‍යාපාරයට එක්වී නොනැසී ජීවත් වන වින්දිතයන්ට සවන් දෙන බව, ඔවුන්ව විශ්වාස කරනු ලබන බව හා උදව් ලබා ගත හැකි සේවා වෙත ඔවුන් යොමු කෙරෙන බව තහවුරු කර ගන්න.
- ප්‍රචණ්ඩත්වයෙන් තොර සතියක් සඳහා වන ව්‍යාපාරයට මම සම්බන්ධ වූයෙමි. ආරක්ෂාව හා ගෞරවය ලැබීම සෑම කෙනෙකුට ම හිමිය.
- ප්‍රචණ්ඩත්වයෙන් තොර සතිය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සිය අත්දැකීම් ගැන කතා කරන අයට සවන්දීමට, ඔවුන් විශ්වාස කිරීමට හා ඔවුන් සමග සම්බන්ධ වීමට කෙරෙන සිහිපත් කිරීමකි.
- ඔබ හෝ ඔබ දන්නා කිසියම් කෙනෙක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අත්විඳින්නේ නම්, උපකාර ලබා ගත හැකිය. සතියේ පැය 24 පුරාම 1800 015 188 ඔස්සේ Safe Steps ඇමතිය හැකිය. ඔබ අනතුරුදායක තත්ත්වයක සිටී නම් 000 අමතන්න.

ඔබ මෙවැනි පණිවුඩ සමාජ මාධ්‍ය (ෆේස්බුක්, ඉන්ස්ටාග්‍රෑම්, ට්විටර්) ඔස්සේ හුවමාරු කර ගන්නා විට, හෑෂ් ටැග් #WWV2023 එකතු කර www.nifvs.org.au/event-directory/week-without-violence/ සමග සම්බන්ධ කරන්න.

## උපකාර පවතියි

උපකාර ලබා දිය හැකි සේවා ගැන සොයා බලන්න: https://www.nifvs.org.au/resources/nifvs-family-violence-resources/family-violence-posters/

Sinhalese | සිංහල